**වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2010 වර්ෂය**

**මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.**

**1 - කොටස - අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු වල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.**

**2 - කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව.**

**I කොටස**

**වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

1. **අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු.**

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |

2. **වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම ගිණුම් වර්ෂයේ ආරම්භයේ පිළියෙල කර තිබණි.

3. **ගිණුම්**

3.1 **විසර්ජන ගිණුම**

(අ) **ගිණුම් ඉදිරිපත් කිරීම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවට අදාල විසර්ජන ගිණුම් 01 ක් 2011 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කර තිබුණි. පහත සඳහන් ගිණුම් 01 විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| අමාත්‍යාංශය | විසර්ජන ශීර්ෂය | ඉදිරිපත් කළ දිනය |
|---|---|---|
| වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය. | 152 | 2011 අප්‍රේල් 08 |

## (ආ) මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 01 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 15,332,126,754 ක් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 11,575,191,913 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ශුද්ධ ඉතිරිවීම රු. 3,756,934,841 ක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් 25% ක ප්‍රතිශතයක් ප්‍රතිපාදන ඉතුරු වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 152 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය. | 1987,235,000 | 7,415,101,754 | 1,908,209,244 | 4,956,328,058 | 79,025,756 | 2,458,773,696 |
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 1,206,590,000 | 4,723,200,000 | 1,126,493,497 | 3,584,161,114 | 80,096,503 | 1,139,038,886 |
| | එකතුව | **3,193,825,000** | **12,138,301,754** | **3,034,702,741** | **8,540,489,172** | **159,122,259** | **3,597,812,582** |

## (ඇ) අයවැය සහය සේවා හදිසි අවශ්‍යතා වගකීම් යටතේ ලබාගත් ප්‍රතිපාදන.

ශීර්ෂ - 152 - වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය මෙහෙයුම් වැඩසටහන මූලධන වියදම් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු. 7,301,754 ක් ලබා ගෙන තිබුණි.

## (ඈ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය.

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙත පහත සඳහන් පරිදි එකතුව රු. 616,771,443 ක් ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

**( i )** **වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය.**

| ප්‍රතිපාදන ලබා දුන් දෙපාර්තමේන්තුව | ලබා දුන් ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය (2010 දෙසැම්බර් 31 දිනට) | ඉතිරිය පිළිබඳ නිරීක්ෂණය |
|---|---|---|---|---|
| | රු | රු | රු | |
| ජාතික අයවැය දෙපාර්තමේන්තුව. | 7,301,754 | - | 7,301,754 | දක්වා නොතිබුණි. |

**(ii)** **වාරිමාර්ග දෙපාර්තමේන්තුව.**

| ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යලය | ලබා දුන් ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතරිය (2010 දෙසැම්බර් 31 දිනට) | ඉතිරිය පිළිබඳ නිරීක්ෂණය |
|---|---|---|---|---|
| | රු | රු | රු | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල | 427,357,755 | 386,489,880 | 40,867,875 | ඉඩම් අත්පත් කර ගැනීමට අදාල වන්දි ගෙවීමේදී මතු වූ නීතිමය අවශ්‍යතා හේතුවෙන් සිදු වූ ඉතිරිවීම්. |
| වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය. | 2,500,000 | 1,500,000 | 1,000,000 | සත්‍ය වියදම් දැරීමෙහි ඉතිරිය |
| මහා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය. | 19,470,183 | 10,620,750 | 8,849,433 | 2010 වර්ෂයේ ඉටුකරන ලද කාර්යයන් සඳහා සත්‍ය වියදම් දැරීමෙන් පසු ඉතිරිය. |
| වනජීවි සංරක්ෂණ අමාත්‍යාංශය. (වෙහෙරගල) | 21,800,000 | 13,873,120 | 7,926,880 | අයහපත් කාලගුණය නිසා වාසස්ථාන සුපෝෂණ කටයුතු අවසන් කිරීමට නොහැකි වීමෙන් ඉතිරි වූ මුදල හා ඩබල් කැබ් රථ දෙකක් මිලදී ගැනීමේදී ඉතිරි වූ මුදල් වල එකතුව. |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අම්පාර | 187,200 | නැත | 187,200 | ඉඩම් අත්පත් කර ගැනීමට අදාල වන්දි ගෙවීමේදී මතු වූ නීතිමය අවශ්‍යතා හේතුවෙන් සිදු වූ ඉතිරිවීම්. |
| වන සංරක්ෂණ අමාත්‍යාංශය | 4,346,000 | 2,828,283 | 1,517,717 | 2010 වර්ෂයේ ඉටු කරන ලද කාර්යයන් සඳහා සත්‍ය වියදම් දැරීමෙන් පසු ඉතිරිය. |

| | | | | |
|---|---|---|---|---|
| වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය. | 1,500,000 | 1,262,000 | 238,000 | සත්‍ය වියදම් දැරීමෙහි ඉතිරිය |
| ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලය. | 99,000,000 | 99,000,000 | - | ඉතිරිවීම් නැත. |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මාතලේ (වැමැඩිල්ල) | 7,008,000 | 6,540,550 | 467,450 | වන්දි ගෙවීමට සිටි වන්දි ලාභියා මිය ගිය අතර උරුමකරුවන් තීරණය කර ගැනීමට අපහසු වූ නිසා ගෙවීමට නොහැකි වීම. |
| වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය. | 500,000 | 210,000 | 290,000 | පරිපාලන වියදම් ඉතිරිය |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හම්බන්තොට | 24,700,000 | 24,591,339 | 108,661 | පරිපාලන වියදම් ඉතිරිය |
| වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය. | 397,261 | 397,261 | - | ඉතිරිවීම් නැත. |
| වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය. | 703,290 | 703,290 | - | ඉතිරිවීම් නැත. |
| | **609,469,689** | **548,016,473** | **61,453,216** | |

## 3.2 අත්තිකාරම් ගිණුම්.

### 3.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්.

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම.**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 01 ක් විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ යුතු රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 02 ක් 2011 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කර තිබුණ.

**(ආ) සීමා පිළිපැදීම.**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 01 ක් වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් පිළිපැද තිබුණ.

### 3.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්.

#### 3.3.1 අග්‍රිම ගිණුම්.

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 01 ක 2010 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුම් වල රු. 7,344,265 ක්වූ හර ශේෂ තිබුණු අතර ඒ පිළිබඳ කාල විශ්ලේශණය පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | වර්ෂ 01 ට අඩු හර |
|---|---|
| | රු. |
| වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය. | 6,920,932 |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව. | 423,333 |
| | 7,344,265 |

#### 3.3.2 පොදු තැන්පත් ගිණුම.

2010 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංහය යටතේ වන දෙපාර්තමේනතු 01 ක පොද තැන්පත් ගිණුමේ ශේෂ එකතුව රු. 362,675,922 ක් වූ අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

## II කොටස

**<u>එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව.</u>**

### 1. විසර්ජන ශීර්ෂය 152 - වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 සැප්තැම්බර් 12 දින අමාත්‍යාංශ ලේකම් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන් දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 1.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 1.4 සිට 1.6 දක්වා ඡේද වල සඳහන් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් 2011 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ශීර්ෂය | ගිණුමේ නම |
|---|---|
| 152 | විසර්ජන ගිණුම |

**(ආ) අයවැය විචලනය**

(i) ශීර්ෂ 152 යටතේ වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු. 194,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 20 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ත් සියයට 88 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම**

2011 අප්‍රේල් 30 දින වන විට වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ පියවා නොතිබුණු අග්‍රිම ශේෂවල එකතුව රු. 6,920,932 ක් වේ.

**(ඈ) පොදු තැන්පත් ගිණුම**

2010 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. 56,805,254 ක් වූ අතර එම ශේෂය තුළ මුදල් රෙගුලාසි 571 හි විධිවිධාන පරිදි කටයුතු කළ හැකිව තිබුණු නමත් එසේ කටයුතු නොකළ වර්ෂ 2 කට වැඩි කාලසීමාවක සිට පැවති තැන්පත් ශේෂවල එකතුව රු. 5,582,166 ක් විය.

**(ඉ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 15201 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2010 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ සැසඳුම් ප්‍රකාශ ප්‍රකාර එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 1,548,735 ක්වූ අතර, එම හිඟ හිට ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 1.4 වත්කම් කළමනාකරණය.

**<u>වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම.</u>**

වෙනත් ආයතන සතුව තිබුණු වාහන විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණු අතර ආයතන 10 කට අයත් වාහන 31 ක් එසේ පාවිච්චි කරන බැව් නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය.

| වත්කම් වර්ගය. | වත්කම් අයත්ව තිබූ ආයතනය | සංඛ්‍යාව | වටිනාකම. රු. | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| වාහන | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 11 | විස්තර ලබා ගත නොහැකි විය | විස්තර ලබා ගත නොහැකි විය |
| | සෞඛ්‍ය අමාත්‍යාංශය | 02 | එම | එම |
| | ජාතිය ගොඩ නැගීමේ අමාත්‍යාංශය. | 02 | එම | එම |
| | වරාය සංවර්ධන හා පුනරුත්තාපන අමාත්‍යාංශය. | 01 | එම | එම |
| | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 10 | එම | එම |
| | ජල සම්පත් ලේකම් කාර්යාලය | 01 | එම | එම |
| | සැපයීම් හා උපදේශාත්මක කාර්යාංශය | 01 | එම | එම |
| | ලංකා විදුලි බල මණ්ඩලය | 01 | එම | එම |
| | වංචා හා දූෂණ විමර්ශණ කාර්යාංශය. | 01 | එම | එම |
| | පොදු ව්‍යාපාර ජනතාකරණය කිරීමේ දෙපාර්තමේන්තුව | 01 | එම | එම |

## 1.5 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **(i)** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 22 | 12 | 10 |
| **(ii)** | තෘතික මට්ටම | 04 | 02 | 02 |
| **(iii)** | ද්විතික මට්ටම | 41 | 26 | 15 |
| **(iv)** | ප්‍රාථමික මට්ටම | 42 | 19 | 23 |
| **(v)** | වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | - | 06 | - |
| | එකතුව | **109** | **65** | **50** |

## 1.6 අභ්‍යන්තර පාලනය

### (අ) ලේඛන තබා ගැනීම

අමාත්‍යාංශය විසින් මු.රෙ 110 ප්‍රකාර හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.

### (ආ) අභ්‍යන්තර විගණනය

මු.රෙ 133 විධි විධාන ප්‍රකාර අමාත්‍යාංශයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි.

### (ඇ) කළමණාකරන හා විගණන කමිටු ක්‍රියාත්මක කිරීම.

අමාත්‍යාංශය විසින් 2010 වර්ෂය සඳහා කළමණාකරන හා විගණන කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි.

## 2. විසර්ජන ශිර්ෂය 282 - වාර්මාර්ග දෙපාර්තමේන්තුව.

වාර්මාර්ග දෙපාර්තමේන්තුවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 සැප්තැම්බර් 13 දින වාර්මාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම.

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 2.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණය.

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව වාර්මාර්ග දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 2.4 සිට 2.12 දක්වා ඡේද වල සඳහන් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු රු. 30,100,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

**(ආ) පොදු තැන්පත් ගිණුම.**

2010 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව ශේෂය අතර රු. 2,137,142 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර 2011 සැප්තැම්බර් දක්වා එම වෙනස නිවැරදි කර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය.**

විෂය අංක 28201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශ 2010 දෙසැම්බර් 31 දින වන විට අයවිම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 20,563,620 ක්වූ අතර, එම හිඟ හිට ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 2.4 වත්කම් කළමනාකරණය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම.**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(i)** මුදල් රෙගුලාසි 756 විධිවිධාන හා 2010 දෙසැම්බර් 17 දිනැති අංක PF/FS/Board of survey/01 දරණ රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් ගේ ලිපියේ උපදෙස් ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් 2010 වර්ෂය වෙනුවෙන් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 41 ක, කලාප කාර්යාල 11 ක සහ ප්‍රධාන කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණ පවත්වා වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ii)** 2010 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත හා ඌනතා සම්බන්ධයෙන් හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්.**

දෙපාර්තමේන්තුව විසින් 2010 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු. 39,239,329 ක් වූ අතර, එය වසරකට අඩු ශේෂයන්ගෙන් සමන්විත විය.

**(ඇ) බාහිර පුද්ගලයින් වෙත ලබා දුන් දෙපාර්තමේන්තුවේ නිල නිවාස.**

දෙපාර්තමේන්තුවට අයත් නව, මහල් නිවාස ව්‍යාපෘතියේ නිවාස 04 ක් දෙපාර්තමේන්තුවෙන් බාහිර ආයතන වල නිලධාරීන්ට හා සේවකයින්ට පදිංචිය සඳහා ලබා දී තිබුණි.

## 2.5 අනුකූල නොවීම්

### (අ) නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි යොමුව. | අනුකූල නොවීම |
|---|---|
| **(i) ආයතන සංග්‍රහය** | |
| xix පරිච්ඡේදය 6.1 වගන්තිය | නිල නිවාස වල බදු කාලය වර්ෂ 05 ක් වුවද රත්මලාන නිවාස සංකීර්ණයේ පදිංචි ඇතැම් නිවාස ලාභීන් වර්ෂ 30 ක පමණ කාලයක් අඛණ්ඩව එම නිවාස වල පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය. |
| **(ii) මුදල් රෙගුලාසි** | |
| මු.රෙ. 104(3) හා 104 (4) | වාහන අනතුරු සිදුවී වර්ෂ ගණනාවක් ගත වී ඇතත් අදාල අලාභානි වාර්තාවන් නියමිත පරිදි යවා නොතිබුණි. |

### (ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි දෙකකට 2007 වර්ෂයේ සිට රු. 763,225 ක වරිපනම් බදු මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

## 2.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා.

**ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්.**

දෙපාර්තමේන්තුව විසින් පහත සදහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපාතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ වර්ෂය | නිම කළ යුතුව තිබූ වර්ෂය | 2010 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | | | රු.මිලියන | |
| කිරම්පුල්වේගේ අමුණ නැවත ඉදි කිරීම | 40 | 1998 | 2008 | 10.4 | විකල්ප යෝජනාවක් සලකා බලමින් පැවතීම |
| හේකිත්ත ගංවතුර පාලනය | 47 | 2005 | 2009 | 27.1 | කොන්ත්‍රාත් කරුගේ ප්‍රමාදයන්. |
| ලුණුගම්වෙහෙර යෝජනා ක්‍රමය | 90 | 2007 | 2009 | 11.9 | නියමු ව්‍යාපෘතියන් බැවින් වැඩ සීමා කිරීම |

## 2.7 කාර්යසාධනය.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකල ප්‍රධාන කාර්යයන්.

**දෙපාර්තමේන්තුවේ සමහර ප්‍රධාන කාර්යයන් ඉටු කර නොතිබූ හෝ ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබූ අවස්ථාවන් විගණනයේදී නිරීක්ෂණය වූ අතර එවැනි අවස්ථාවන් කීපයක් පහත දැක්වේ.**

**( i )** 2005 වර්ෂයේදී රු. මිලියන 42 ක ඇස්තමේන්තුවක් අනුව දෙපාර්තමේන්තුව විසින් හෙට්ටිගේ ඇල ව්‍යාපෘතිය වර්ෂ 04 කදී නිම කිරීමට සැලසුම් කර වැඩ ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම තුලින් කඩුවෙල හා හෝමාගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ වල ගොවි පවුල් 2,000 කට ආසන්නව කුඹුරු අක්කර 2,400 කට වගා කටයුතු සිදු කිරීම අරමුණු කරගෙන තිබුණි. කෙසේ වෙතත් 2010 දෙසැම්බර් 31 දින වන විට රු. 21,472,108 ක් වියදම් කර ඇතත් ව්‍යාපෘතියේ වැඩ අවසන් කර නොතිබුණි.

**(iii)** රඹුක්කන් ඔය ව්‍යාපෘතියේ ප්‍රධාන ඇල හා බෙදුම් ඇල මාර්ග ඉදි කිරීම සඳහා රු. මිලියන 499.6 ක් ඇස්තමේන්තු කර තිබූ අතර 2009 වර්ෂය සඳහා රු. මිලියන 3 ක් ද, 2010 වර්ෂයේ අගෝස්තු දක්වා රු. මිලියන 10 ක වියදමක් ද දරා තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතිය සැලසුම් කරන ලද මූල්‍ය හා භෞතික ප්‍රගතිය කරා ළඟා වී නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

**2.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු.**

දෙපාර්තමේන්තුවේ 2010 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු ප්‍රකාශවල දැක්වුණු ගැලැපුම් පිළිබඳ විග්‍රහයට අනුව නිකුත් කල නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ පිළිබඳව කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| ගැලැපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | එකතුව |
|---|---|---|---|
| | මාස 6 වැඩි වර්ෂ 1 ට අඩු | වර්ෂ 1ට වැඩි 3 ට අඩු | |
| | රු. | රු. | රු. |
| නිකුත් කල නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 228,179 | 399,782 | 627,961 |

**2.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දෙපාර්තමේන්තුවට 2009 නොවැම්බර් මාසයේ වායු සමීකරණ යන්ත්‍ර 10 ක් රු. 2,753,100 කට මිලට ගෙන තිබූ අතර එයින් යන්ත්‍ර 05 ක් එකඟ වූ මාදිලියට නොගැලපෙන බවත් යන්ත්‍ර 2 ක් 2010 නොවැම්බර් මාසය වන විටද ක්‍රියා විරහිතව තිබූ බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

**2.10 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

දෙපාර්තමේන්තුවට අයත් කැටපිලර් ක්‍රෝලර් ට්‍රැක්ටර් යන්ත්‍රයක් අම්පාර යාන්ත්‍රික වැඩපලෙහි අලුත්වැඩියා කර 2010 පෙබරවාරි 06 දින රඹුක්කන් ඔය වැඩ බිමට රැගෙන ගොස් පැය 2 ක කාලයක් වැඩ කිරීමෙන් අනතුරුව ක්‍රියාවිරහිත වී නැවත අලුත්වැඩියා සඳහා ගාල් කිරීමට සිදුවී තිබුණි. අම්පාර යාන්ත්‍රික ඉංජිනේරු වෙතින් මෙම යන්ත්‍රය සඳහා දරන ලද අලුත්වැඩියා වියදම විගණනය විසින් ඉල්ලා සිටියද 2010 නොවැම්බර් මාසය දක්වා එම තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**2.11 කළමණාකරන දුර්වලතා**

**පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය විය.**

2007 පෙබරවාරි 28 දිනැති අංක : 07/0326/356/006 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ තීරණ ප්‍රකාර රඹුක්කන් ඔය ව්‍යාපෘතියට අවශ්‍ය කරන ක්‍රෝලර් ට්‍රැක්ටර් 2 ක්, කොන්ක්‍රීට් මිශ්‍රණ 5 ක් හා එයාර් කොම්ප්‍රෙෂර් 01 ක් මිලට ගැනීමට අනුමැතිය ලබා දී තිබුණ ද 2010 ජූලි 31 දින වන විටත් මෙම යන්ත්‍ර හා උපකරණ මිලට ගෙන නොතිබුණි. තවද ක්‍රෝලර් ට්‍රැක්ටර් 2 සහ කොන්ක්‍රීට් මිශ්‍රණ 5 ක් මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත්තේ අවශ්‍යතාවයන් පිළිබඳ නිසි අධ්‍යනයකින් තොරව බැව් වාරිමාර්ග අධ්‍යක්ෂජනරාල්වරයාගේ පැහැදිලි කිරීම් අනුව නිරීක්ෂණය විය.

## 2.12 මානව සම්පත් කළමනාකරණය.

### අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 324 | 269 | 55 |
| (ii) | තෘතික මට්ටම | 147 | 34 | 113 |
| (iii) | ද්විතික මට්ටම | 2,432 | 1,362 | 1,070 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1,823 | 1,516 | 307 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 415 | - |
| | එකතුව | 4,726 | 3,596 | 1,545 |